AIA Insurance Lanka PLC (Co. No. PQ 18)
Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com
AIALIFE.COM.LK

Media Release

# මෙවර පොසොන් සමයේදී 24 දෙනෙකුගේ දිවි ගලවා ගැනේ

**දශක දෙකක් තුළ සුරකින ලද ඉහළම ජීවිත සංඛ්‍යාව**

මෙවර පොසොන් රැකවරණ වැඩසටහන සඳහා AIA රක්ෂණ සමාගම, ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය ශ්‍රී ලංකා නාවික හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා එක්ව ජීවිතාරක්ෂකයින් 720 දෙනෙකු යොදා ගනු ලැබුවේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් අනුරාධපුර ප්‍රදේශයේ ජලාශ පිටාර ගැලීම නිසා බැතිමතුන් වෙත එල්ල විය හැකිව තිබූ දැඩි ජීවිත තර්ජනය වළකාලීමේ අරමුණිනි. මෙම උතුම් කටයුත්තෙහි ප්‍රතිඵලයක් වශයෙන් AIA පොසොන් රැකවරණ සමාජ සත්කාරක වැඩසටහන ඇරඹුනු දා සිට සුරකින ලද ඉහළම ජීවිත සංඛ්‍යාව 24ක් ලෙස මෙවර වාර්තා විය. එමෙන්ම මෙම වසරේ දියේ ගිලීම නිසා සිදුවන මරණ සම්පූර්ණයෙන්ම වළකා ගැනීමට ද හැකිවිය.

AIA රක්ෂණ සමාගම අඛණ්ඩව වසර 22ක් තිස්සේ මෙම පරිපූර්ණ පොසොන් රැකවරණ වැඩසටහන දියත්කරන අතර අනාරක්ෂිත ස්ථානයන්හි දියනෑමේ අවදානම පිළිබඳ පූජා නගරය වෙත පැමිණෙන බැතිමතුන් දැනුවත් කෙරෙන්නා වූ දැන්වීම් පුවරු බැනර් ආදියෙන් මෙන්ම පුළුල් මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපෘතියකින් ද සමන්විත වේ. පොසොන් රැකවරණ වැඩසටහන අනුරාධපුර පූජා නගරයෙන් ඔබ්බට ගෙන යමින් දඹුල්ල, පොළොන්නරුව සහ දිඹුලාගල, ප්‍රදේශයන් වෙතද ව්‍යාප්ත කිරීමට සමාගම කටයුතු යෙදීය.

''මෙම වසරේ අපගේ පොසොන් රැකවරණ වැඩසටහන අන් කවරදාටත් වඩා ජාතික වැදගත්කමකින් යුක්ත වූයේ වසර 1993 දී මෙම ප්‍රජා සත්කාරක ව්‍යාපෘතිය ඇරඹුනු තැන් පටන් මේ දක්වා වන ඉහළම ජීවිත සංඛ්‍යාව මෙම වසරේදී ගලවා ගැනීමට හැකි වූ නිසයි. දීප ව්‍යාප්ත පුළුල් ප්‍රචාරණ ව්‍යාපෘතියක් ඔස්සේ බැතිමතුන් දැනුවත් කරමින් ද අනතුරුදායක ස්ථානයන්හි දිය නෑමේදී ඔවුන්ගේ ආරක්ෂාව උදෙසා පූර්ණ සුදුසුකම් ලත් ජීවිතාරක්ෂකයින් යොදවා ගනිමින් ද දියේ ගිලීම් ආශ්‍රිත මරණ සම්පූර්ණයෙන්ම පාහේ වළකා ගැනීමට හැකි වීම පිළිබඳව අප අතිශය සතුටට පත් වෙනවා.'' යනුවෙන් සමාගමෙහි අලෙවි අංශ ප්‍රධානි සුරේන් පෙරේරා පැවසීය.